# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1794/15 - 2013 ජනවාරි මස 22 වැනි අඟහරුවාදා - 2013.01.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී - බී 8/2007.

**2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත**

2007 අංක 35 දරන සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 36 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) සහ (ඉ) ඡේද සමඟ කියවිය යුතු එහි 67 වන වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

විදුලිබල හා බලශක්ති අමාත්‍ය.

2013 ජනවාරි මස 10 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග, 2012 අංක 1 දරන උපකරණවල බලශක්ති කාර්ය සාධන ප්‍රමිති (සීලිං විදුලිපංකා) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. කිසිම තැනැත්තකු විසින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සීලිං විදුලිපංකා, SLS 1600:2011 යනුවෙන් නිශ්චිතව දක්වා ඇති ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූල නොවන්නේ නම් ඒවා ශ්‍රී ලංකාවට ආනයනය කිරීම හෝ ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කිරීම නොකළ යුතු ය.

3. මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් සීලිං විදුලිපංකාවක් ආනයනය කරනු ලබන හෝ නිෂ්පාදනය කරනු ලබන යම් තැනැත්තකුට, අවස්ථාවෝචිත පරිදි, අනයනය කරනු ලබන හෝ නිෂ්පාදනය කරනු ලබන යම් සීලිං විදුලිපංකාවක්, එහි අනුරූපී ආකෘතිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රමිති SLS 1600:2011 හි නිශ්චිතව දක්වා ඇති තරු අනුක්‍රමණ හා අනුකූල වන බවට සහතික කරමින්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරනු ලබන සහතිකයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමේ බලය අධිකාරිය සතුවේ. එසේ ඉදිරිපත් කරනු ලබන සහතිකයක් සාක්ෂි වශයෙන් ආවේශ්‍යය කරනු ලැබිය යුතු අතර, එය, එහි ඇතුළත් කාරණා සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් ද වන්නේ ය.

4. මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සීලිං විදුලිපංකා ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන හෝ ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන සෑම තැනැත්තකුම විසින්, ශ්‍රී ලංකා ප්‍රමිති SLS 1600:2011 හි නිශ්චිතව දක්වා ඇති ආකෘතිය, මිණුම් සහ ප්‍රමාණයන්ට අනුකූල වන්නා වූ සහ අදාළ තරු අනුක්‍රමණ ප්‍රදර්ශනය කර ඇති බලශක්ති ලේබලයක්, සීලිං විදුලිපංකාවේ සහ එය අසුරා ඇති කවරය, දවටනය හෝ පෙට්ටියෙහි අලවා තැබීමට සලස්වනු ලැබිය යුතු ය. එසේ ප්‍රදර්ශනය කොට ඇති තරු අනුක්‍රමණ, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් එම අනුක්‍රමණවල නිරවද්‍යතාව සහතික කරමින් නිකුත් කරනු ලබන සහතිකයක් මඟින්, සත්‍යායනය කරනු ලැබිය යුතු ය.

5. ශ්‍රී ලංකාවට ආනයනයනය කරනු ලබන හෝ ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් සීලිං විදුලිපංකාවක් එය අඩංගු වන කවරයට හෝ දවටනයට හෝ බහාලූ පෙට්ටියට හෝ සවි කොට ඇති බලශක්ති ලේබලයක් මෙම නියෝගවල 4 වන නියෝගය මඟින් පනවා ඇති නියමයන්ට අනුකූල නොවන්නේ නම්, එවැනි සීලිං විදුලිපංකා ගබඩා කිරීම, ප්‍රදර්ශනය කිරීම, තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ බෙදා හැරීම, කිසිදු තැනැත්තකු විසින් නොකළ යුතු ය.

6. පනතේ විධිවිධාන ප්‍රකාරව මෙම නියෝගවල 2 වන, 4 වන හෝ 5 වන නියෝග මඟින් පනවා ඇති නියම හා අනුකූලවීම පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු කරනු ලැබූ විටක දී, එම වරද සඳහා පනවා ඇති දඬුවමට අමතරව, එම වරද සිදුකරනු ලැබුවේ යම් සීලිං විදුලිපංකා සම්බන්ධයෙන් ද, එම සීලිං විදුලිපංකා බැහැර කිරීම හෝ විනාශ කිරීම සඳහා සහ එසේ බැහැර කිරීම හෝ විනාශ කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් නියෝගයක් කරන මෙන් අධිකරණයෙන් ඉල්ලා සිටීමට අධිකාරියට බලය ඇත. තවද, අධිකාරිය විසින්, ඒවා එසේ බැහැර කිරීම හෝ විනාශ කිරීම සඳහා වැය වන වියදම එම වරදකරු විසින් දැරිය යුතු බවට එම අධිකරණ නියෝගය මඟින් විධිවිධාන සලස්වන ලෙස ඉල්ලා සිටිය හැකි ය.

7. මෙම නියෝගවල :-

"පනත" යන්නෙන් 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත අදහස් වේ;

"අධිකාරිය" යන්නෙන් 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේහි 2 වන වගන්තිය මඟින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය අදහස් වේ ; සහ

"ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය" යන්නෙන් 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත මඟින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය අදහස් වේ.

**උපලේඛනය**

තල 2 ක් හෝ වැඩි ගණනක් සහිත පිසලන විෂ්කම්භය මි.මී 1400 සහ වේග පාලකයේ අවම පිහිටීම් 5 ක් සහිත යම් සීලිං විදුලිපංකා.

02 - 259